පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **කතෝලික ධර්මය I, II**

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : **පැය 03 යි.**

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි.**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

01. ප්‍රඥා සාහිත්‍යයට අයත් පොතකි.
(1) උත්පත්ති (2) වීරාවලිය (3) ප්‍රේම ගී (4) දානියෙල්

02. ලේඛනගත වී නැති ජේසුස් වහන්සේ කළ කී දේ ශුද්ධ වූ සභා මාතාව අපට දායාද කරන්නේ,
(1) ජීවන සහා සම්ප්‍රදායෙනි. (2) ශුද්ධ බයිබලයෙනි. (3) සුබාරංචි මගිනි. (4) වාචික සම්ප්‍රදායෙනි.

03. අපෝස්තලික යුගයේ දී ශුද්ධ වූ සභාවට මහගු සේවයක් කළ විශිෂ්ඨ පුද්ගලයෙකි.
(1) ශුද්ධ වූ ජුසේවාස් පියතුමා (2) ශුද්ධ වූ පාවුලු තුමා
(3) ශුද්ධ වූ ස්නාවක ජුවාම් තුමා (4) යෙසායා දිවැසිවරයා

04. ශුද්ධ වූ පාවුලු තුමා විසින් කිතුනු බැතිමතෙකුට ලියන ලද පෞද්ගලික ලිපියකි.
(1) කොලොස්සි ලිපිය (2) පිලිප්පි ලිපිය (3) පිලමොන් ලිපිය (4) රෝම ලිපිය

05. එළිදරව් සාහිත්‍ය තුළ අංක 10න් සංකේතවත් වන්නේ,
(1) විශ්වය යි. (2) දේව ජනතාව යි. (3) පූර්ණත්වය යි. (4) පරිපූර්ණත්වය යි.

06. ජේසුස් වහන්සේ ව අත්අඩංගුවට ගැනීමෙන් පසු උන්වහන්සේ ව හෙරෝද් වෙත යැවීමට හේතුව වූයේ,
(1) ජේසුස් වහන්සේ ගලීල වැසියෙක් නිසා (2) එවකට උත්තම පූජකයා ඔහු නිසා
(3) අවසන් තීන්දුව හෙරෝද් සතු නිසා (4) ජේසුස් වහන්සේ ව දැක ගැනීමට ආශාවෙන් සිටි නිසා

07. පාස්කුවෙන් පසු ජුදා ජනතාව සැමරූ ප්‍රධාන මංගල්‍යයකි.
(1) නත්තල් මංගල්‍යය (2) පෙන්තකොස්ත මංගල්‍යය (3) ස්වර්ගාරෝහන මංගල්‍යය (4) ශුද්ධාත්ම මංගල්‍යය

08. තුන් වන ධර්මදූත චාරිකාවෙන් පසු පාවුලු තුමා නැවතී සිටියේ,
(1) අන්තියෝකියේ ය. (2) ගලාතියේ ය. (3) ජෙරුසලමේ ය. (4) ග්‍රීසියේ ය.

09. 1912 වර්ෂයේ දී අනුරාධපුරයෙන් සොයාගත් කුරුසයෙන් ඒත්තු ගන්වන්නේ,
(1) පෘතුගීසි සමයේ මෙරට කතෝලිකයන් සිටි බවයි.
(2) පෘතුගීසි පැමිණීමට පෙර මෙරට ක්‍රිස්තු භක්තිකයන් සිටි බවයි.
(3) ලන්දේසි සමයේ මෙරට කතෝලිකයන් සිටි බවයි.
(4) නිදහස් යුගයේ මෙරට කතෝලිකයන් සිටි බවයි.

10. '.......... භෝජනය මම ය. මා වෙත පැමිණෙන යමෙක් වේද ඔහුට ......... නොවන්නේ ය.' ශු. ජොහාන් 6:35ට අනුව හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,
(1) ජීවනදායක, සාගිනි (2) සදාතන, කුසගිනි (3) සහනදායක, පිපාස (4) අමරණීය, සාපිපාසා

11. අඛණ්ඩ ව පැවැත්විය යුතු වත්පිළිවෙතක් මෙන්ම ප්‍රේමයේ හා එකමුතුකමේ ප්‍රසාද නිධානයක් වන්නේ,
(1) ප්‍රසාද ස්නාපනය ය. (2) සමගිවීමේ දේව ප්‍රසාද නිධානය ය.
(3) ආශිර්වාදකාර බන්ධනය ය. (4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ය.

12. පුරාණ ගිවිසුමේ ජනවන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව වූයේ,
(1) යාච්ඤාවේ නිරත වීම ය. (2) යාග පූජා පුද කිරීම ය. (3) දිව්‍ය පූජාව පැවැත්වීම ය. (4) ධූප කැඩීම ය.

13. වර්ෂ 1910 දී ශුද්ධ වූ තෙරේසා මව්තුමිය උපත ලද්දේ,
(1) ඉන්දියාවේ දී ය. (2) පෝලන්තයේ දී ය. (3) ඇල්බේනියාවේ දී ය. (4) ප්‍රංශයේ දී ය.

14. පොරොන්දු හා බාරහාර සම්බන්ධ වැරදි ප්‍රකාශය නම්,
(1) අපගේ භක්ති අභ්‍යාසයේ කොටසකි. (2) බාරහාර ඉටු කිරීම කිතුනුවන් නොකළ යුතුය.
(3) බාර ඉටු කිරීම දෙවියන් වහන්සේට ගරු බිය පෑමකි. (4) එය දෙවියන් වහන්සේට ප්‍රේමය දැක්වීමකි.

15. ''ජීවිතය ගැන දෙවියන් වහන්සේ ඉදිරියේ වගකීම සැම පුද්ගලයෙකුට ම ඇත. ජීවිතයේ අධිපතියාණෝ මහෝත්තම වූ දෙවියන් වහන්සේ ය.'' මෙලෙස අපට ඉගැන්වීම් කරන්නේ,
(1) 1 කොරින්ති ලිපිය යි. (2) කතෝලික සභා ධර්මෝපදේශය යි.
(3) මහෝපදේශය යි. (4) ශාසන නීතිය යි.

16. ''අපගේ වස්තූන්හී කිසිම සහභාගිත්වයක් දිළිඳුන් සමග නොමැත්තේ නම් ඒ වනාහී ඔවුන් සතු දේ සොරකම් කිරීමකි.'' මෙසේ පවසන්නේ,
(1) ශු. ජෝන් ක්‍රිසොස්තම් තුමා ය. (2) ශු. ඉග්නාසියුස් තුමා ය.
(3) ශු. ජෝන් මේරි වියානි තුමා ය. (4) ශු. අගොස්තීනු තුමා ය.

17. ඉච්ඡාබස්, ව්‍යාජ පාරට්ටු කිරීම් හා ඉවක් බවක් නොමැතිව ප්‍රශංසා කිරීම් යනාදිය පාපයන් වන්නේ කී වෙනි පනතට විරුද්ධව ද?
(1) 2 වන පනතට (2) 7 වන පනතට (3) 10 වන පනතට (4) 8 වන පනතට

18. පහත මංගල්‍ය දින අතරින් ණය මංගල්‍යය දිනයක් නොවන්නේ,
(1) ජනවාරි 01 වන දා ය. (2) අගෝස්තු 15 වන දා ය.
(3) සැප්තැම්බර් 08 වන දා ය. (4) දෙසැම්බර් 08 වන දා ය.

19. ගෙනෙන පඬුරු අතරින් පූදසුන මත තබනුයේ,
(1) ධූප හා මිදියුෂ ය. (2) මුදල් සම්මාදම් හා ධූප, මිදි යුෂ ය.
(3) ගෙනෙන ඕනෑම පඬුරක් ය. (4) කිසිවක් තැබිය නොහැකි ය.

20. කිතුනු සභා සංවාදයේ ප්‍රතිඵලයක් වන්නේ,
(1) සාමාජීය කටයුතුවල දී සුහදතාව ඇති වීම (2) කතෝලික සභාවට විශේෂ තැනක් ලැබීම
(3) ශුද්ධ බයිබලයේ පොත් 73ක් බව සම්මත වීම (4) 1983 දී නව සිංහල ශුද්ධ වූ බයිබලය දොරට වැඩීම

21. එලොහිම් සම්ප්‍රදායෙන් ඉදිරිපත් කරන කතා පුවතකි.
(1) මැවීම පිළිබඳ පළමු කතාව (2) නෝවා සහ ජල ගැල්ම
(3) ඊසාක් පූජා කිරීම (4) ආබ්‍රහම් තුමා සමග ගිවිසුම

22. උදාර චින්තනයකින් යුක්තව විප්‍රවාසගත ඉශ්‍රායෙල් ජනතාව තුළ නව බලාපොරොත්තු ඇති කළේ,
(1) ජෙරමියා දිවැසිවරයා ය. (2) එසකියෙල් දිවැසිවරයා ය.
(3) යෙසායා දිවැසිවරයා ය. (4) ශෙපනියා දිවැසිවරයා ය.

23. පහත ප්‍රකාශ කියවන්න.
A උත්පත්ති පොතේ 01 වන පරිච්ඡේදයේ සිට 11 වන පරිච්ඡේදය දක්වා කොටස යි.
B ආදී පිතෘ ආබ්‍රහම්තුමාගේ කැඳවීමෙන් ආරම්භ වේ.
C විශ්වයේ හා මිනිසාගේ ආරම්භය දෙවියන් වහන්සේගෙන්ම වූ බව අවධාරණය කරයි.
D මෙහි ඇත්තේ විද්‍යාත්මක හා ඓතිහාසික පණිවිඩයකි.
මෙම ප්‍රකාශ අතරින් ප්‍රාග් ඉතිහාසය හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
(1) A හා C ය. (2) A හා B ය. (3) B හා D ය. (4) C හා D ය.

24. දෙවියන් වහන්සේ ආදම් හා ඒවට හම් වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ,
(1) දෙවියන් වහන්සේගේ කරුණාව, ආදරය හා රැකවරණය යි. (2) දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට සමාන බව යි.
(3) ගැළවීමේ පොරොන්දුව යි. (4) ආදම් හා ඒව පිට තැබූ ලකුණ යි.

25. කීල් හා මැලියම් තවරන ලද පන් පෙට්ටියක සිටි රුවැති දරුවා වූයේ,
(1) ජෝසෙප් ය. (2) නෝවා ය. (3) මෝසෙස් ය. (4) රූබන් ය.

26. දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග ඇති කර ගත් ගිවිසුම ඉදිරිපත් කරන සම්ප්‍රදායන් නම්,
(1) J හා E ය. (2) E හා D ය. (3) J හා P ය. (4) P හා D ය.

27. පූජක නිල පිළිවෙළින් ස්වාමින් වහන්සේගේ ශුද්ධස්ථානයට සුවඳ දුම් පූජා කිරීමේ වාරය සෙකරියස් තුමාට ලැබුනේ,
(1) තම වගකීමෙන් ය. (2) දේව අනකින් ය. (3) තම කැමැත්තෙන් ය. (4) දාදු දැමීමෙන් ය.

28. ජේසුස් වහන්සේ පරික්ෂා ජය ගත් පසු වැඩම කරන ලද ධර්මශාලාව පිහිටියේ,
(1) දාවිත්ගේ නුවර ය. (2) නාසරෙත් නුවර ය. (3) කානා නුවර ය. (4) ජෙරුසලම් නුවර ය.

29. ශුද්ධ වූ මතෙව් තුමාගේ ශුභාරංචියේ 13 වන පරිච්ඡේදය හා සම්බන්ධ වඩාත් නිවැරදි පිළිතුර නම්,
(1) දේව රාජ්‍යයේ වටිනාකම් ගැන කියවෙන උපමා වැඩි වශයෙන් ඇත.
(2) ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳව සඳහන් කර ඇත.
(3) භාග්‍ය අට ඉදිරිපත් කර ඇත.
(4) ජේසුස් වහන්සේගේ බෞතිස්ම ස්නාපනය සම්බන්ධව දක්වා ඇත.

30. ස්වර්ග රාජ්‍යයට ඇතුළුවීම සඳහා ප්‍රසාද ස්නාපනය ලැබීමේ වැදගත්කම ගැන ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ,
(1) සිරේනියේ සීමොන්ට ය. (2) මාර්තා හා මරියාට ය. (3) සකේවුස්ට ය. (4) නිකදේමුස්ට ය.

31. සියල්ලට වැඩියෙන් දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම මුල් කර ගෙන ප්‍රේමය නිසා ඇති වන මනස්ථාපය හඳුන්වන්නේ,
(1) භයාධික මනස්ථාපය නමින් ය. (2) පශ්චත්තාපය නමින් ය.
(3) දයාධික මනස්ථාපය නමින් ය. (4) ඇතුළාන්ත මනස්ථාපය නමින් ය.

32. පූජකවරයෙහි පූර්ණත්වය හිමි වන්නේ,
(1) පූජාප්‍රසාදි ධූරයට ය. (2) රාජගුරුප්‍රසාදි ධූරයට ය. (3) කාදිනල් ධූරයට ය. (4) පාප් ධූරයට ය.

33. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ,
(1) 2 වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය. (2) ෆ්‍රැන්ක් ඩෆ් මහතා ය.
(3) ලියෝ ජෝශප් කාදිනල් කාඩයින් හිමි ය. (4) භාග්‍යවන්ත පෙඩ්රික් ඕසනම් තුමා ය.

34. ''ෂමාර්'' යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය නම්,
(1) සංරක්ෂණය කිරීම ය. (2) වගා කිරීම ය. (3) පාලනය කිරීම ය. (4) පරිපාලනය කිරීම ය.

35. වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමයත්, අවිශ්වාසයෙන් යුත් තැනට විශ්වාසයත් බලාපොරොත්තු සුන් තැනට බලාපොරොත්තුවත් ගෙන යන්නට වරම් ඉල්ලමින් කියන යැදුමයි.
(1) මරිය තුමියගේ නිර්මල හෘදයට යාච්ඤාව (2) ස්වාමිවාක් ආරාධනාව
(3) පාස්කු කාලයේ තුන්කාල ආරාධනාව (4) අසීසියේ ෆ්‍රැන්සිස් මුනිතුමාගේ යාච්ඤාව

36. පහත දැක්වෙන පුණ්‍ය ක්‍රියා අතර ශාරීරික පුණ්‍ය ක්‍රියාවක් වන්නේ,
(1) අඥානයන්ට ඉගැන්වීම (2) වැරදි කමා කිරීම
(3) මළවුන් වැළලීම (4) සැක ඇති අයට දැනුමැතිකම් දීම

37. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව ස්වාමිවාක් ආරාධනාව උච්චාරණයේ දී අප තුළ තිබිය යුතු ගුණාංග නම්,
(1) විශ්වාසය, බැහැපත්කම, සතුට ය. (2) ඇදහිල්ල, විශ්වාසය, ධෛර්යය ය.
(3) දේව භය, ප්‍රේමය, ප්‍රඥාව ය. (4) තේරුම් ගැනීම, දැනගැන්ම, බැහැපත්කම ය.

38. ක්‍රිස්තු වර්ෂ තෙවන ශතවර්ෂයේ සිට පැවත එන දේව මෑණියන් හා සම්බන්ධ යැදුමකි.
(1) නමෝ මරිය (2) ස්වාමිදරුවන්ගේ සුවිශුද්ධ වූ මෑණියනි
(3) තුන්කාලේ ආරාධනාව (4) අප රට වෙනුවෙන් දේව මෑණියන්ට යාච්ඤාව

39. යාම යැදුම සිදු කරන යාම ගණන
(1) 4 කි. (2) 3 කි. (3) 2 කි. (4) 5 කි.

40. 'ලෙක්සියෝ ඩිවීනා' හෙවත් ධ්‍යානශීලී කියවීම දෙවන පියවර නම්,
(1) ස්වාමින් වහන්සේට ආරාධනා කිරීම යි. (2) ශුද්ධ ලියවිල්ල කියවීම යි.
(3) දේව වචනය මෙනෙහි කිරීම යි. (4) දේව වචනය ඇසුරෙන් යාච්ඤා කිරීම යි.

(ලකුණු 1X40=40)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **කතෝලික ධර්මය I, II**

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

## කතෝලික ධර්මය II

(i) **පළමු ප්‍රශ්නය** හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
(ii) **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

01. (i) ජේසුස් වහන්සේ කුරුසයේ එල්ලා සිටි අවස්ථාවේ උන්වහන්සේට සරදම් කළ ආකාර **දෙකක්** ලියන්න.
(ii) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් **දෙකක්** ලියන්න.
(iii) නත්තල් සමය තුළ අප සමරන වැදගත් මංගල්‍යය **දෙකක්** ලියන්න.
(iv) අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේ ජේසුස් වහන්සේ සිදු කළ කාර්යයන් **දෙකක්** ලියන්න.
(v) දේශක දිවැසිවරුන් ගැන සඳහන් වන ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.
(vi) වහල් මෙහෙවරේ සිටිය දී ඉශ්‍රායෙල් ජනතාව ගොඩනගන ලද ගබඩා නගර **දෙක** නම් කරන්න.
(vii) ආත්මික මව්පියන් වීමට තිබිය යුතු සුදුසුකම් **දෙකක්** ලියන්න.
(viii) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන සෙසු ප්‍රසාද නිධානවලින් වෙනස් වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.
(ix) තාපස පැවිදි දිවියට විනය මාලාවක් සකස් කළ **දෙදෙනා** නම් කරන්න.
(x) අපගේ ආත්මික ජීවිතයට අවශ්‍ය වන ආහාර වර්ග **දෙක** සඳහන් කරන්න. (ලකුණු 2X10=20)

02. (i) හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද **දෙකක්** ලියන්න. (ලකුණු 02)
(ii) ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප **තුනක්** ලියන්න. (ලකුණු 03)
(iii) පාපී බලවේගවලින් පිරී ඇති වත්මන් සමාජයේ අප ප්‍රඥාවන්තව කටයුතු කළ යුතු ආකාර **පහක්** විස්තර කරන්න. (ලකුණු 05)

03. (i) මයසීදාවයෙන් කටයුතු කිරීම පිළිබඳව අපට උගන්වන දේව පනත් **දෙක** ලියන්න. (ලකුණු 02)
(ii) මයසීදාවය ඇතිව දිවි ගෙවන්නට අප කළ යුතු දේවල් **තුනක්** ලියන්න. (ලකුණු 03)
(iii) නිර්මල වූ සිතින් පිවිතුරු දිවියක් ගත කරන්නට දේව වචනය ඔබට කොතරම් දායක වන්නේදැයි කරුණු **පහක්** ඇසුරින් විස්තර කර දක්වන්න. (ලකුණු 05)

04. (i) ප්‍රසාද ස්නාපනයේ දී දරුවාට සුදු වස්ත්‍රය පැළඳවීමෙන් සංකේතවත් කරන අදහස් **දෙකක්** ලියන්න. (ලකුණු 02)
(ii) අභිවෘද්ධි ආලේපය මගින් ලැබෙන වරප්‍රසාද **තුනක්** ලියන්න. (ලකුණු 03)
(iii) අභිවෘද්ධි ආලේපයෙන් අපට ලැබෙන වරප්‍රසාද තුළ ඔබගේ පවුලේ ඔබ ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) මැවීම පිළිබඳ දෙවන කතාවට අනුව දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් **දෙක** ලියන්න. (ලකුණු 02)
(ii) මැවිල්ල ආරක්ෂා නොකිරීමෙන් අපට අත්විඳිය හැකි ප්‍රතිවිපාක **තුනක්** ලියන්න. (ලකුණු 03)
(iii) දේව ආදරයේ ප්‍රතිමූර්තියක් වන දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබ ක්‍රියා කරන ආකාර **පහක්** විස්තර කරන්න. (ලකුණු 05)

06. (i) ජේසුස් වහන්සේ උගන්වා වදාළ යාච්ඤාව අඩංගු ශුභාරංචි **දෙක** නම් කරන්න. (ලකුණු 02)
(ii) ස්වාමිවාක් ආරාධනාවේ සඳහන් ප්‍රශංසාත්මක පැතුම් **තුන** ලියන්න. (ලකුණු 03)
(iii) යාච්ඤාව කිතුනුවකුගේ ජීවිතයට බද්ධ වී තිබිය යුතුතේ කුමක් නිසාදැයි කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න. (ලකුණු 5X2=10)
(i) පාද දෝවනය හා ප්‍රේමයේ පනත
(ii) චතාරික සමය හා බැඳෙන විවිධ භක්ති අභ්‍යාස
(iii) පූජාප්‍රසාදින් වහන්සේලා වෙනුවෙන් ගිහියන්ගේ යුතුකම්
(iv) මරිය තුමිය ශුද්ධ වූ සභාවේ මාතාව යි.

***

**අවසාන වාර පරීක්ෂණය**
**කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය**
**11 ශ්‍රේණිය**
**I කොටස**

01. (3) ප්‍රේම ගී
02. (1) ජීවන සහා සම්ප්‍රදායෙනි.
03. (2) ශුද්ධ වූ පාවුලු තුමා
04. (3) පිලමොන් ලිපිය
05. (4) පරිපූර්ණත්වයයි.
06. (1) ජේසුස් වහන්සේ ගලීල වැසියෙක් නිසා
07. (2) පෙන්තකොස්ත මංගල්‍යය
08. (3) ජෙරුසලමේ ය.
09. (2) පෘතුගීසි පැමිණීමට පෙර මෙරට ක්‍රිස්තු භක්තිකයන් සිටි බවයි.
10. (1) ජීවනදායක, සාගිනි
11. (4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ය.
12. (2) යාග පූජා පුදුකිරීම ය.
13. (3) ඇල්බීනියාවේ දී ය.
14. (2) බාරහාර ඉටු කිරීම කිතුනුවන් නොකළ යුතුය.
15. (2) කතෝලික සහා ධර්මෝපදේශය යි.
16. (1) ශු. ජෝන් ක්‍රිසොස්තම් තුමා ය.
17. (4) 8 වන පනතට
18. (3) සැප්තැම්බර් 08 වන දා ය.
19. (1) පූප හා මිදියුෂ ය.
20. (4) 1983 දී නව සිංහල ශුද්ධ වූ බයිබලය දොරට වැඩීම
21. (3) ඊසාක් පූජා කිරීම
22. (2) එසකියෙල් දිවැසිවරයා ය.
23. (1) A හා C ය.
24. (1) දෙවියන් වහන්සේගේ කරුණාව, ආදරය හා රැකවරණය යි.
25. (3) මෝසෙස් ය.
26. (3) J හා P ය.
27. (4) දාදු දැමීමෙන් ය.
28. (2) නාසරෙත් නුවර ය.
29. (1) දේව රාජ්‍යයේ වටිනාකම් ගැන කියවෙන උපමා වැඩි වශයෙන් ඇත.
30. (4) නිකදේමුස්ට ය.
31. (3) දයාධික මනස්ථාපය නමින් ය.
32. (2) රාජගුරුප්‍රසාදි ධූරයට ය.
33. (3) ලියෝ ජෝශප් කාදිනල් කාඩයින් හිමි ය.
34. (1) සංරක්ෂණය කිරීම ය.
35. (4) අසීසියේ ෆ්‍රැන්සිස් මුනිතුමාගේ යාච්ඤාව
36. (3) මළවුන් වැළලීම
37. (1) විශ්වාසය, බැහැපත්කම, සතුට ය.
38. (2) ස්වාමිදරුවන්ගේ සුවිශුද්ධ වූ මෑණියනි
39. (1) 4 කි.
40. (3) දේව වචනය මෙනෙහි කිරීම යි. (ලකුණු 1X40=40)

**II කොටස**

01. (i) කාඩි පිළිගැන්වීම/ වස්ත්‍ර බෙදා ගැනීමට දාදු දැමීම/ 'ජේසු නසරේනු ජුදයන්ගේ රජ' යනුවෙන් කුරුසියට ඉහළින් තැබූ පුවරුව

(ii) පූප කැඩීම/ ස්වාමින් වහන්සේගේ රාත්‍රී භෝජනය/ නව පාස්කු මංගල්‍යය/ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගිකම

(iii) දෙසැම්බර් 25 ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය/ ශුද්ධ වූ පවුලේ මංගල්‍යය/ පාරිශුද්ධ දේව මාතාවන් වන මරියෝත්තමාවන්ගේ මංගල්‍යය/ දිව්‍ය බිළිඳාණන් රජුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යය

(iv) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම/ පූජකවරය ස්ථාපිත කිරීම/ අපෝස්තුළුවරුන්ගේ පාද දෝවනය කිරීම/ උත්තම පූජක යාච්ඤාව භාවිතා කරමින් දෙවිඳුන්ට යාච්ඤා කිරීම

(v) 1 සාමුවෙල්/ 2 සාමුවෙල්/ 1 රාජාවලිය/ 2 රාජාවලිය

(vi) පීතෝම්/ රාමසෙස්

(vii) ආරම්භක දේව ප්‍රසාද නිධාන ලබා තිබීම/ අවුරුදු 16 ඉක්මවා තිබීම/ විශ්වාසය තුළ ජීවත් වීම හා තමන්ගේ කාර්ය භාරය පිළිබඳ අවබෝධයක් තිබිය යුතු වීම/ ශුද්ධ වූ සභාව විසින් ප්‍රකාශ කරන ලද කිසිම දඬුවමකට යටත් නොවූවකු වීම/ දරුවාගේ දෙමාපියන් විසින් අනුමත කරනු ලැබූවකු වීම/ දරුවාගේ දෙමාපියන් නොවිය යුතුය/ එම කාර්යය ඉටු කිරීමට කැමැත්ත හා හැකියාව තිබිය යුතු වීම

(viii) ධර්මදූත මෙහෙවරක් පැවරීම/ දේව ජනතාව ගොඩනැගීම/ අන් අය ගැලවීම තුළින් තම ගැලවීම සලසා ගනී

(ix) ශුද්ධ වූ බෙනඩික් තුමා/ ශුද්ධ වූ පැකෝමියස් තුමා

(x) දෙවියන් වහන්සේගේ වචනය/ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

(ලකුණු 2X10=20)

02. (i) පවුල හා ගෝත්‍රික ප්‍රඥාව/ රාජ්‍ය සභා ප්‍රඥාව/ අභිධාර්මික ප්‍රඥාව/ එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව (ලකුණු 02)

(ii) ප්‍රස්ථාව පිරුළු/ උපදේශ/ කතාන්දර/ සංකල්පනා/ ගීත (ලකුණු 03)

(iii) මිතුර මිතුරියන් තෝරා ගැනීමේ දී/ නවීන තාක්ෂණික මෙවලම් භාවිත කිරීමේ දී/ කණ්ඩායම් ලෙස එකතු වී ගන්නා තීරණවල දී ඒවා තම ජීවිතයට කොතරම් සුදුසු ද යන්න ආදී වශයෙන් කරුණු පහක් විස්තර කර තිබිය යුතුය. (ලකුණු 05)

03. (i) කාමමිථ්‍යාචාරය නොකරන්න/ පරදාර ආලය නොකරන්න. (ලකුණු 02)

(ii) යාච්ඤා කිරීම/ ශුද්ධ වූ බයිබලය කියවීම/ දිව්‍ය පූජාවට සහභාගි වීම/ දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම (ලකුණු 03)

(iii) ප්‍රශ්නයට අදාළව කරුණු පහක් ලියා එය විස්තර කර දැක්විය යුතුය. (ලකුණු 05)

04. (i) ආත්මික පිරිසිදුකම/ නැවත වරප්‍රසාද ජීවිතයකට ඔසවනු ලැබීම/ අන්‍ය රූප විලාශවීමේ දී ක්‍රිස්තුන් වහන්සේ ඇඳ සිටි ධවල වස්ත්‍රය/ උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ ඇඳුමේ සංකේතය යි. (ලකුණු 02)

(ii) ප්‍රසාද ස්නාපනීය වරප්‍රසාද ගැඹුරු වීමකුත්, වර්ධනය වීමකුත් සිදුවේ/ ශුද්ධ වූ සභාවේ පූර්ණ සාමාජිකත්වය ලැබේ./ දිව්‍යමය දාරකත්වයකින් 'අබ්බා පියාණනී' කියා අමතනු ලැබීමට හැකි වේ. / ක්‍රිස්තුන් වහන්සේ සමග තිරසාර ව ඒකාබද්ධ කරන්නේ ය./ අප තුළ ශුද්ධාත්ම දීමනා වැඩි වර්ධනය කරන්නේ ය/ (11 ශ්‍රේණිය පෙළ පොත 63 පිටුව) (ලකුණු 03)

(iii) ප්‍රශ්නයට අදාළව කරුණු පහක් විස්තර කර දැක්විය යුතුය. (ලකුණු 05)

05. (i) වගා කිරීම/ රැකබලා ගැනීම (ලකුණු 02)

(ii) ගංවතුර/ නියග/ නායයාම් ආදී ස්වභාවික ව්‍යසනයන් දක්වා තිබීම /බෝ වන රෝග පැතිරීමෙන් මිනිස් ජීවිත විනාශ වීම (ලකුණු 03)

(iii) සොබා දහමට ආදරය කිරීම හා ගරු කිරීම/ පොළොවේ සශ්‍රීකත්වය ආරක්ෂා කිරීම/ අප ජීවත් වන පරිසරය ලස්සන කිරීම/ පරිසරයේ සමතුලිතතාව ආරක්ෂා කිරීම/ පරිසරය දූෂනය කිරීමෙන් මිදී එය වැලැක්වීමට දායක වීම/ සරල දිවි පෙවතකට හුරු වීම/ අනාගත පරපුර වෙනුවෙන් සම්පත් ඉතිරි කිරීම ආදී ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

06. (i) ලූක් ශුභාරංචිය/ මතෙව් ශුභාරංචිය (ලකුණු 02)

(ii) ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා/ ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා/ ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහි ද ඉටු වේවා. (ලකුණු 03)

(iii) ප්‍රශ්නයට අදාළව කරුණු පහක් විස්තර කර දැක්විය යුතුය. (ලකුණු 05)

07. (i) 10 ශ්‍රේණිය කතෝලික ධර්මය පෙළ පොත 51-53 පිටු

(ii) 10 ශ්‍රේණිය කතෝලික ධර්මය පෙළ පොත 108, 109 පිටු

(iii) 11 ශ්‍රේණිය කතෝලික ධර්මය පෙළ පොත 75 පිටුව

(iv) 11 ශ්‍රේණිය කතෝලික ධර්මය පෙළ පොත 120 පිටුව (ලකුණු 5X2=10)

***


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න